# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2238/8 – 2021 ජූලි මස 27 වැනි අඟහරුවාදා – 2021.07.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2014 ජූනි මස 25 වැනි දින අංක 1868/50 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රයෙහි (460 වැනි අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2014 අංක 140 දරන ආඥාවේ ඇතුලත් ඉඩම් කොටස් සම්පූර්ණයෙන්ම රජය සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටස්වල සන්තකය ද ලබා ගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඉඩම් අමාත්‍ය සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම එකී ඉඩම් කොටස් අතුරින් පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/6/2014/ HW/96.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: WEG/LAN/L1/ACQ/49.
2021 අප්‍රේල් මස 22 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

### උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළේ බටහිර සුළු කොට්ඨාසයේ, අංක 387ඒ, පැලැන බටහිර, අංක 388 පොල්වත්ත ග්‍රාම නිලධාරි කොට්ඨාසවල, පැලැන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක මාර 2635 හා 2015.10.29 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස:

01. කැබලි අංක 1 – වෙට්ටිගෙකොරටුව – ප්‍රමාණය: හෙක්. 0.0112 ක් පමණ

උතුරට: පොල්වත්ත පාර සහ සුසාන භූමිය; නැගෙනහිරට: ඩබ්. ජනක චන්ද්‍ර කුමාර හිමිකම් කියන වෙට්ටිගෙකොරටුව; දකුණට: ඩබ්. ජනක චන්ද්‍ර කුමාර හිමිකම් කියන වෙට්ටිගෙකොරටුව සහ පොල්වත්ත පාර; බටහිරට: පොල්වත්ත පාර.

08 - 62

1A – G34718 – 20 (2021/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*